# මධ්‍යම පරිසර අධිකාරිය
மத்திய சுற்றாடல் அதிகாரசபை
Central Environmental Authority

පරිසර පියස, 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka. Web: www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. CEA/06/EPU/PC&PR/09/2024 ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. දිනය / திகதி / Date 2024.11.06

## මාධ්‍ය නිවේදනය

### රත්මලාන - බඩෝවිට ප්‍රදේශයේ ඇළ මාර්ගයක් රතු පැහැවීම පිළිබඳ කලබලයට පත්නොවන්නැයි මධ්‍යම පරිසර අධිකාරිය මහජනතාවගෙන් ඉල්ලා සිටී

රත්මලාන, බඩෝවිට ප්‍රදේශයේ ඇළ මාර්ගයක් රතු පැහැවීම පිළිබඳ කලබලයට පත් නොවන ලෙස මධ්‍යම පරිසර අධිකාරිය මහජනතාවගෙන් ඉල්ලා සිටී. 2024 නොවැම්බර් මස 05 වැනි දින පෙරවරුවේ සිට මෙම ඇළ මාර්ගයේ ජලය රතු පැහැවී තිබේ. මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඊයේ (05) ලද තොරතුරකට අනුව, මධ්‍යම පරිසර අධිකාරියේ බස්නාහිර පළාත් කාර්යාලය විසින් එදින ම (05) මේ පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර ඇත.

වර්ණකයක් අදාළ ඇළ මාර්ගය වෙත මුදා හැරීම හේතුවෙන් ඇළ මාර්ගයේ ජලයේ වර්ණය මෙලෙස වෙනස්වී ඇති බව මෙම ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී අනාවරණ විය. එම අවස්ථාවේ දී ම සිදුකළ හැකි පරීක්ෂණ අදාළ ස්ථානයේ දී ම මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදුකරන ලදී. මෙම වර්ණකය ජලයේ දියවන (ජල ද්‍රාව්‍ය) වර්ණකයක් වන බවත් පීච් (PH) අගයන් සහ පරාමිතීන්, පවතින පාරිසරික තත්ත්වයට අනුකූල වන බවත් ඉන් ඉහළ අගයන් නොපෙන්වන බවත් එම පරීක්ෂණවල දී අනාවරණ වී ඇත. තවද, වැඩිදුර පරීක්ෂණ සිදුකිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ජල තත්ත්ව පසු විපරම් රසායනාගාර නිලධාරීන් විසින් ජල නියැදි ලබා ගත් අතර එම ජල නියැදි පරීක්ෂණ සඳහා යොමු කර ඇත.

තවදුරටත් සිදුකළ සොයා බැලීම්වල දී අනාවරණ වූයේ ප්‍රදේශයේ පුද්ගලයකු විසින් මෙම වර්ණකය අදාළ ඇළ මාර්ගය වෙත මුදා හැර ඇති බවයි. වෙළෙඳසැලකින් ඉවත් කළ අදාළ වර්ණකයේ සැලකියයුතු ප්‍රමාණයක් නිවසට රැගෙන ගොස් ගබඩාකර තැබීමේ දී වර්ෂාවට හසුවීම නිසා එය මෙලෙස ඇළ මාර්ගයට මුදා හැර ඇති බවත් මෙතරම් ගැටලුකාරී තත්වයක් ඇතිවේ යැයි තමන් නොසිතූ බවත් එම වර්ණකය පරිසරයට මුදා හැරි පුද්ගලයා විසින් ප්‍රකාශ කර ඇත. තවද, එම පුද්ගලයා දෙහිවල පොලීසිය මගින් අත්අඩංගුවට ගෙන පොලිස් ඇප මත නිදහස් කර ඇති අතර උසාවියට ඉදිරිපත් කිරීමට නියමිත ය.

වර්ණකයක් හේතුවෙන් මෙම ඇළ මාර්ගය රත් පැහැ වී ඇති බැවින් එම ඇළ මාර්ගය හා සබැඳි අනෙකුත් ජල මාර්ග වෙත ද වර්ණකය විසරණය (පැතිරියාම) විය හැකි බවත්, එනිසා එම අනෙකුත් ජල මාර්ගවල ජලයේ ද පැහැයේ වෙනසක් ඇති විය හැකි බවත් මෙම තත්ත්වය මත කලබලයට පත් නොවන ලෙසත් මධ්‍යම පරිසර අධිකාරිය මහජනතාවගෙන් තවදුරටත් ඉල්ලා සිටී. අදාළ පරීක්ෂණවල දී ජල මාර්ගයේ මසුන් මිය යෑමක් නිරීක්ෂණයවී නොමැති අතර කෙසේ වෙතත් පරීක්ෂණ කටයුතු සිදුකෙරෙමින් පවතින බැවින් අදාළ ඇළ මාර්ගයේ ජලය දෛනික කටයුතු සඳහා භාවිත නොකරන ලෙස ද මධ්‍යම පරිසර අධිකාරිය ජනතාවගෙන් ඉල්ලා සිටී.




| Chairman | Tel : 2872361, 2872348 Fax : 2872347 | Director General | Tel : 2872359 Fax : 287260 | General Office | Tel : 2872278, 2873447, 2872419, 2873448, 7877277-280 | Complaint : 2888999 |
|---|---|---|---|---|---|---|

| D. D. G | HRD. Admin. & Finance | Envt. Pollution Control | Envt. Mgt. & Assess. | Envt. Edu. & Awareness | Waste Mgt. | Regional Oper. |
|---|---|---|---|---|---|---|
| | Tel : 2865296 Fax : 2877515 | Tel : 2873453 Fax : 2872605 | Tel : 2872388 Fax : 2872296 | Tel : 2872297 Fax : 2872609 | Te. 2872409 Fax : 2882152 | Tel : 2872370 |

පරිසර අමාත්‍යාංශය | சுற்றாடல் அமைச்சு | Ministry of Environment

මධ්‍යම පරිසර අධිකාරියේ බස්නාහිර පළාත් කාර්යාලයේ නිලධාරීහු, මධ්‍යම පරිසර අධිකාරියේ ජල තත්ත්ව පසුවිපරම් රසායනාගාරයේ නිලධාරීහු, දෙහිවල පොලිස් පරිසර ඒකකයේ නිලධාරීහු සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීහු මෙම ක්ෂේත්‍ර පරීක්ෂණය සඳහා සහභාගී වූහ.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

පී. බී. හේමන්ත ජයසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම පරිසර අධිකාරිය